රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 21/2006(1)

මගේ අංකය:ආ/4/3/1/14-1
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2007.07.17

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**රාජ්‍ය ආයතන, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල තාවකාලික, අනියම්, ආදේශක සහ කොන්ත්‍රාත් පදනම මත**
**<u>බඳවාගත් සේවකයන් ස්ථිර කිරීම</u>**

**2006.12.06** දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **21/2006** කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

**02.** එහි III ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කරමින් සංශෝධනය කිරීමට රජය තීරණය කර ඇත.

III (අ) තනතුරට අදාළ අනුමත බඳවාගැනීමේ පරිපාටියේ දක්වා ඇති සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(ආ) අදාළ තනතුරේ බඳවා ගැනීම් පරිපාටියේ නියමිත අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති වුවද පුරප්පාඩු තනතුරක **2006.11.01** දිනට සතුටුදායක සහ අඛණ්ඩව අවුරුදු තුනක (03) සේවා කාලයක් සපුරා ඇති සේවකයින්ට, රජයේ පුහුණු ආයතනයක් මගින් පවත්වනු ලබන තනතුරට අදාළ පුහුණු වැඩසටහනකට සහභාගී වී සහතිකයක් ලබාගැනීමෙන් අනතුරුව පුරප්පාඩු තනතුරුවල සේවා ස්ථිරත්වය පිරිනැමිය හැක.

(ඇ) මේ සඳහා පුහුණු ආයතන ලෙස රාජ්‍ය සේවා පුහුණු ආයතනය, රජයේ කාර්මික විද්‍යාල, තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය පිළිගත හැකි අතර, තනතුරට අදාළයයි පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන දින **3**ක පූර්ණකාලීන පුහුණු වැඩසටහනක් ප්‍රමාණවත් වේ.

(ඈ) **2007.06.30** දින වන විට එසේ පුහුණු වැඩසටහනක් සාර්ථකව නිම කර ඇති සේවකයන් **2007.07.01** දින සිට ක්‍රියාත්මක වන සේ ස්ථිර කළ හැකිය. පුහුණු වැඩසටහනකට සහභාගී වී නොමැති සේවකයන් වෙනුවෙන් ඉහත (ඇ) ඡේදයේ සඳහන් ආයතන මගින් යෝග්‍ය පාඨමාලාවක් සංවිධානය කරවාගෙන, පුහුණුව සාර්ථකව නිම කළ පසු ස්ථිර පත්වීම් ලබාදිය යුතුය. එබඳු පාඨමාලා **2007.10.31** දිනට පෙර පවත්වා අවශ්‍ය පියවර ගැනීම අදාළ පත්වීම් බලධාරියාගේ වගකීමක් වේ.

**03.** මින් ඉදිරියට තාවකාලික, අනියම්, ආදේශක හෝ කොන්ත්‍රාත් පදනමින් වුවද එවැනි තනතුරුවලට නියමිත සුදුසුකම් නොමැති අය බඳවා ගනු ලැබුවහොත් අදාළ පත්වීම් බලධාරියා ඒ පිළිබඳව වගකිව යුතුය.

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය